<u>වක්‍ර පිරිවැය/කම්හල් පොදු කාර්ය පිරිවැය -Indirect cost /Overhead cost(Factory)</u>

නිෂ්පාදන ඒකක සමඟ වෙන් වෙන් වශයෙන් හඳුනා ගත නොහැකි හෝ එසේ හඳුනා ගත හැකි වුවත් ප්‍රමාණාත්මක ලෙස සලකා බැලීමේදී වටිනාකමින් අඩු ස්වභාවයේ වියදම් වේ.මෙම පිරිවැය වක්‍ර හෙවත් කම්හල් පොදු කාර්ය පිරිවැය වියදම් ලෙස සලකන අතර මෙය ද පහත පරිදි වර්ග කෙරේ.

1.**<u>වක්‍ර ද්‍රව්‍ය පිරිවැය</u>**

නිෂ්පාදන ඒකක සමඟ හඳුනාගත නොහැකි හෝ ප්‍රමාණාත්මක වටිනාකමක් නොමැති ද්‍රව්‍ය සඳහා වන පිරිවැයයි.ඇතැම් විට නිෂ්පාදන කළත්, නොකළත් මෙවැනි පිරිවැයන් දැරීමට සිදුවේ.උදා - නූල්,තෙල්

2.**<u>වක්‍ර ශ්‍රම පිරිවැය</u>**

නිෂ්පාදන ඒකක සමඟ හඳුනා ගත නොහැකි හෝ නිෂ්පාදන ක්‍රියාවලිය සඳහා වක්‍ර ලෙස දායක වන ශ්‍රමය සඳහා වන පිරිවැයයි.

උදා- සෘජු ශ්‍රමිකයන් නොවන ඕනෑම ශ්‍රමිකයෙකුට ගෙවන වැටුප්

3.**<u>වක්‍ර වියදම් පිරිවැය</u>**

නිෂ්පාදන ඒකක සමඟ හඳුනා ගත නොහැකි හෝ ප්‍රමාණාත්මක ලෙස බලපෑමක් ඇති නොකරන ද්‍රව්‍ය හා වක්‍ර ශ්‍රමය සඳහා වන පිරිවැය හැර අනෙකුත් පිරිවැයන් වේ.

උදා - ගොඩනැගිලි කුලී,යන්ත්‍ර ක්ෂය ආදිය

කම්හල් පොදු කාර්ය පිරිවැය



වක්‍ර ද්‍රව්‍ය පිරිවැය වක්‍ර ශ්‍රම පිරිවැය වක්‍ර වියදම් පිරිවැය

<u>අභ්‍යාස</u>

1.නිෂ්පාදන පිරිවැය යනු කුමක්ද?එය ගණනය කරන්නේ කෙසේද?